පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය -

විෂය - නර්තනය

13 ශ්‍රේණිය

සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
රා/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

# I වාරය

නිපුණතාව - 1.0 නර්තනය හා සබැඳි මූල ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම - 1.4 පූජා භාණ්ඩ නිවැරදිව හසුරවමින් නර්තන අංග ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - 1.4 බුලත් පදය නර්තන අංගය ඉදිරිපත් කරමු.

ඉගෙනුම් ඵල -

- බුලත් පදය නර්තන අංගයෙහි පසුබිම හා සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.
- බුලත් පදය නර්තන අංගයෙහි පද හා අවසන් කිරීමේ පද ත්‍රිවිධ ලයට තාල තබමින් කියයි.
- පූජා භාණ්ඩ අතැතිව නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව බුලත් පදය නර්තනය කරයි.
- සාමූහිකත්වයෙන් බුලත් පදය නර්තනාංගය ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රවණතා ප්‍රදර්ශනය කරමින් නර්තනාංගය ඒකලව ඉදිරිපත් කරයි.

ශිෂ්‍යා කළයුතු කාර්යයන් -

- බුලත් පදය නර්තනය ඇතුළත් දෘශ්‍ය පටයන් ඇසුරු කරන්න.
- ගුරුවරයා ඇසුරු කර ගනිමින් බුලත් පදය අභ්‍යාස කරන්න.
- පූජා භාණ්ඩ හසුරුවන ආකාරය නරඹන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- **You Tube** නාලිකාව - https://youtu.be/RY5Gbv40hRc

ඇගයීම් -

- බුලත් පදය නර්තනාංගයෙහි සුවිශේෂී ලක්ෂන දෙකක් විස්තර කරන්න.
- සාමූහිකත්වයෙන් බුලත් පදය නර්තනය ඉදිරිපත් කරන්න.
- ඒකලව බුලත් පදය නර්තනාංගය ඉදිරිපත් කරන්න.

පහත ඇගයීම් ද සිදුකරන්න.-

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 07 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

පසු ක්‍රියාකාරකම් -

- බුලත් පදය වේදිකාවට උචිත ලෙස නිර්මාණය කොට පාසල් විවිධ ප්‍රසංගයට ඉදිරිපත් කරන්න.
- බුලත් පදය නර්තානාංගයට සුදුසු රංග වස්ත්‍රාභරණ කට්ටලයක් නිර්මාණය කරන්න.